# නියමුවන් රහිත ගුවන් යානා

**මගී සහ භාණ්ඩ ප්‍රවාහන ගුවන්යානා මෙන්ම ගුවන්යානා තාක්ෂණයේ තවත් එක් අංශයක් වන්නේ නියමුවන් රහිත ගුවන්යානා තාක්ෂණයයි. රටක පවතින ආරක්ෂක නීති පද්ධතිය සමග සීමිත පිරිසක් අතර පවතින ජනප්‍රියව පවතින මෙම ගුවන්යානා, ජාතික ආරක්ෂක කටයුතු සඳහා වන ගුවන් හමුදා මෙහෙයුම් සඳහාත් සිතියම් නිර්මාණය වැනි ජාතික කර්තව්‍යයන් සඳහාත් යොදා ගත හැකි අතර මහා පරිමාණයෙන් පවත්වාගෙන යනු ලබන ගොවිපොළවල් පාලනය සඳහා ද අපරදිග රටවල භාවිත කරනු ලැබේ.**

ජපානය, චීනය, ඇමරිකාව, ඉන්දියාව, ආදී ලොව විශාල රාජ්‍යයන් නියමු රහිත ගුවන් යානා තාක්ෂණය තම ආරක්ෂක කටයුතු සඳහා බහුල වශයෙන් යොදා ගන්නා රටවල් අතර ප්‍රධාන තැනක් ගනී. එත්සත් රාජධානිය, ඔස්ට්‍රේලියාව, රුසියාව, ජර්මනිය ආදී රටවල් වල ගොවිපළ හිමිකරුවන් තම විශාල ගොවිපළ වල් පාලනය සඳහාත් ඒවායේ ආරක්ෂක කටයුතු සඳහාත් නියමු රහිත ගුවන්යානා බහුලව යොදා ගනී.

එමෙන්ම යම් රටක යම් පුද්ගලයකු මෙම ගුවන්යානාවක් තමා සතුව තබාගන්නේනම් සහ එම ගුවන්යානය ගුවන් ගත කිරීමේ දී එම රටේ ආරක්ෂක නීතීන්ට යටත්ව රටෙහි ආරක්ෂක අමාත්‍යාංශයෙන් හා ගුවන් සේවා අමාත්‍යාංශයන් ගෙන් අවසරයක් හා බලපත්‍රයක් ලබාගත යුතු අතර මෙම ගුවන්යානා ගුවන් ගත කිරීමට අවසර දුන් කලාපයන් හී පමණක් ගුවන් ගත කළ යුතුය. එසේ නොමැතිව නියමු රහිත ගුවන්යානයක් ළඟ තබාගැනීම හෝ ගුවන් ගත කිරීම එම රටෙහි නීති රීතින්ට අනුව දඬුවම් ලැබිය හැකි වරදක් වෙයි.

එහෙත් වර්තමානයේ දී ලොව ප්‍රබල රාජ්‍යයන්ගේ නීතින් ලිහිල් කර ඇති බැවින් නියමු රහිත ගුවන්යානා ගුවන්ගත කිරීම විනෝදාංශයක් ලෙසද භාවිතා කරන අතර, ක්‍රීඩාතරග පටිගත කිරීමට ද භාවිතා කෙරේ.

නියමුවන් රහිත මෙම ගුවන්යානා මගී ප්‍රවාහන ගුවන්යානා තාක්ෂණයට සමාන තාක්ෂණයකින් යුක්තවන අතර, එම යානාවන් මෙහෙයවනු ලබන ආකාරයටම දුරස්ථ පාලක යන්ත්‍රයක් මගින් මෙහෙයවනු ලැබේ.

නියමුවන් සහිත ගුවන්යානයකට සමානත්වයක් පිටතින් දැක්වුවද මේවායේ වට ප්‍රමාණය අඟල් 60 ක් ද රාමුවෙහි දිග අඟල් 52.5 ද වන අතර පියාපත් ව්‍යාප්තව පවතින ප්‍රදේශය අවම ලෙස අඟල් 67.2 පමණ වෙයි. මෙම යානාවන්ගේ බර සාමාන්‍ය වශයෙන් කිලෝග්‍රෑම් 5ක් පමණ වේ.

තවද, මෙම යානාවන්ට භාවිත කරනු ලබනුයේ එන්ජින් ධාරිතාව 46 (46CC)පිස්ටන් එන්ජිමක් වන අතර ස්ට්‍රෝක් - 2 (2-Stroke)සිලින්ඩරයක් භාවිතා කර ඇත. මෙම යානයන් ක්‍රියාත්මක කිරීමේ දි භාවිත කරනු ලබන ඉන්ධන වනුයේ මෙතනෝල්(Methanol )හෝ කැස්ට්‍රොයිල්(Castroil)වේ.



ගුවන්යානා තාක්ෂණය පිළිබඳ දැන ගැනීමට කැමැත්තක් දක්වන ජනතාවගේ ප්‍රමාණය දිනෙන් දින වැඩිවෙමින් පවතී. ගුවන්යානා තාක්ෂණය පිළිබඳව හැදෑරීම සඳහා විශාල පිරිසක් ගුවන් යානා නිපදවන රටවලට ලොව සෑම රටකින්ම පාහේ දිනෙන් දින ඇදෙමින් පවතී. එමනිසා විදේශීය වූ පාඨමාලා මේ වන විට ආරම්භ කර ඇත. ගුවන්යානා ක්ෂේත්‍රය යනු ලොව ඉතාම වේගයෙන් දියුණුවන සහ ඉතාම හොඳ තත්ත්වයේ ගෙවීමක් ද ලබන ක්ෂේත්‍රයකි. මෙම ක්ෂේත්‍රය තුළ ඉදිරියේ දී විශාල පෙරළියක් ඇතිකිරීම සඳහා පරිගණක තාක්ෂණය හා චන්ද්‍රිකා තාක්ෂණය මාර්ගයෙන් ගුවන්යානා අවශ්‍ය ස්ථානය කරා ගමන් කරවීමට ඊට අවශ්‍ය පරිගණක මෘදුකාංගයක් නිපදවීම සඳහා කටයුතු සිදුකරමින් පවතින අතර එහි පරීක්ෂණ කටයුතු ද මේ වන විට සාර්ථක මට්ටමක පවතී.

මෙම නියමු රහිත ගුවන්යානා තාක්ෂණය පිළිබඳ දැනීමක් ලබා ගැනීමට ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල තුළ පාඨමාලාවක් නොමැති අතර එම තත්ත්වය මග හැර දුරස්ථපාලක ගුවන්යානා හැසිරවීම ලංකාව තුළ ප්‍රචලිත කිරීම සඳහා" AEROMOELLERS CLUB" නමින් දුරස්ථ පාලක ගුවන්යානා සංගමයක් ලංකාවේ පිහිටුවා ඇත. ශ්‍රී ලංකාවේ ආරක්ෂක නීතින්ට යටත්ව සීමිත පිරිසකට අයත්ව තිබූ ගුවන්යානා තාක්ෂණය වැඩි පිරිසක් වෙත රැගෙන යාම සඳහා මෙම ආයතනය පිහිටුවා ඇත.

ඒ යටතේ ගුවන්යානා හඳුන්වා දීම ගුවන් යානා ආකෘති නිර්මාණය, ගුවන්යානා පද්ධතිය පිළිබඳ තොරතුරු, ගුවන්යානා මාර්ග වලින් තොරතුරු, දුරස්ථපාලක භාවිතය නඩත්තුව හා දුරස්ථපාලක ගුවන්යානා අලුත්වැඩියාව, ඒ සඳහා අවශ්‍ය උපකරණ පිළිබඳ දැනීම, ගුවන්යානා සඳහා භාවිත කරන ඉන්ධන සහ ඉන්ධන ටැංකිය පිස්ටනය, එන්ජිම පිළිබඳවද දැනීමක් ලබා දීමට ඔවුන් කටයුතු කරනු ලබන අතර ඒ පිළිබඳව ප්‍රායෝගික දැනීමක් ලබාදීමටද කටයුතු කරනු ඇත. එය සති 10 ක පාඨමාලාවකි.

ගුවන්යානා ක්ෂේත්‍රයේ රැකියාවක් කිරීමට උනන්දුවක් දක්වන කාහටත් මෙහි පාඨමාලා සඳහා සහභාගි විය හැකි අතර ඒ පිළිබඳ තොරතුරු Asian Aviation Center, Colombo Airport, Ratmalana යන ලිපිනයෙන් ලබාගත හැකිය.

❑

**රෝහණ ජයලාල්**